# 01 තිරස් අතට විහිදුණ පොරොන්දු සහ බැඳීම් (Horizontal Commitments)

## වෙළඳපොළ සීමා කිරීම

ලබාදී ඇති බැඳීම් සහ එකඟතාවන් අනුව ඉන්දියානුවන් හට ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කළ නොහැකි අංශයන් වන්නේ (ගිවිසුමේ Horizontal Commitments 3. (a) ට අනුව)

1. **Money lending** (Banking is open to India) මුදල් පොළියට දීම (බැංකු සහ ලීසිං ඉන්දියාවට විවෘත කිරීමෙන් පසු)

2. **Pawn brokering -** උකස් ගැනීම

3. **Retail trade with a capital of less than US$ 1million -** ඇමරිකානු ඩොලර් මිලියන 1 කට අඩු ප්‍රාග්ධනයකින් යුත් සිල්ලර වෙළඳාම (සුපිරි වෙළඳසැල් වැනි)

4. **Coastal Fishing -** වෙරළාසන්නයේ ධීවර කර්මාන්තය

ශ්‍රී ලාංකිකයන් සඳහා පමණක් වෙන්කර ඇති ඉහත අංශ 4 රටෙහි ආර්ථික ප්‍රගතියට කිසිදු දායකත්වයක් ලබාදිය නොහැකි අංග බව ඕනෑම අයකුට තේරුම් ගතහැක.

# 02. විශේෂිත පොරොන්දු සහ බැඳීම්

## 2.1 ව්‍යාපාර සේවාවන් - පරිගණක සම්බන්ධ රැකියා

(ii) සෑම ඇමරිකානු ඩොලර් ලක්ෂයක (US $ 100,000) ආයෝජනයකටම 10% බැගින් **සමස්ථ සේවක මණ්ඩලයේ** තාක්ෂණික සේවකයින්ගේ ප්‍රතිශතය 50% ක් දක්වා ඉන්දියානුවන් යොදවා ගැනීමට ඉඩ දීමටද ශ්‍රී ලංකාව එකඟ වී ඇත.

## 2.2 ශ්‍රව්‍ය දෘෂ්‍ය සේවාවන් (Audio visual services)

ලංකාවේ සිනමාශාලා 25 ක 50% ක අයිතිය ඉන්දියානුවන් වෙත ලබාදීම

එම සිනමා ශාලා වල දර්ශන කාලයෙන් 40% ක් දමිළ සහ හින්දි ඇතුළුව ආනයනික චිත්‍රපට සඳහා ලබාදීමට එකඟ වීම

## 2.3 වීසා නිකුත් කිරීම

4 වන පරිච්ඡේදයට අනුව වෙළඳාම සඳහා පැමිණෙන පුද්ගලයින්ට දින 180 කට එනම් මාස 06 කට නොවැඩි කාලයක් සඳහා වීසා නිකුත් කළ යුතුයි.

## 4 වන පරිච්ඡේදයේ - iii වන වගන්තිය - ස්වාභාවික පුද්ගලයන්ගේ ආගමනය

**ව්‍යාපාර සඳහා පැමිණෙන අමුත්තන් (Business Visitors)** බහුවිධ සංචාර වීසා සඳහා හිමිකම් ලබන අතර ඒ සඳහා වන සුදුසුකම **තම රටෙහි ඕනෑම වෙළඳ සංවිධානයකින් / සංගමයකින් ලබාගත් ලිපියක් ඉදිරිපත් කිරීම පමණක් වේ**

එකී වීසා සඳහා වන ඉහත සුදුසුකම් සපුරා නොතිබුණද අදාළ කාලයට නොඅඩු කාලයකට බහුවිධ සංචාරක වීසා සඳහා හිමිකම් ලැබිය හැක.

## තිරස් බැඳීම් සහ පොරොන්දු

වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා වන සීමාවන්

අංක 4 - ස්වභාවික පුද්ගලයන්ගේ ප්‍රවේශය පිළිබඳ සීමාවන්

**A**. Business Visitors - ව්‍යාපාර සඳහා පැමිණෙන අමුත්තන්

**B.** Contractual Service Suppliers (Employment of Juridical Person - කොන්ත්‍රාත් පදනම මත සේවා සපයන්නන්

**C.** Intra- Corporate transferees – අන්තර් සමාගම් සේවක මාරු වීම් ලබන්නන්

**D.** Independent Professionals – ස්වාධීන වෘත්තිකයන්

## B & C of Article III

ඉහත iii වන වගන්තියෙහි B කොටස යටතේ ඉන්දියානුවන්හට ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා වීසා ලබාගැනීමට අවශ්‍ය වන්නේ සේවා ගිවිසුමක් ඇතිකරගත් බවට වන ලිපියක් ඉදිරිපත් කිරීම පමණි.

## C. අන්තර් සමාගම් සේවක මාරුවීම්

අන්තර් සමාගම් සේවක මාරුවීම් ලබන්නන් සඳහා නිශ්චිත කාලය සඳහා හෝ ගිවිසුම් කලය සඳහා තාවකාලික ප්‍රවේශයට ඉඩ සලසා ඇත.

(එකී පැමිණෙන පුද්ගලයන් සංඛ්‍යාව පිළිබඳ සීමාවක් දක්වා නැත. එය 100% වීමටද ඉඩ ඇත.)

## 4 වන පරිච්ඡේදයේ IV වන වගන්තිය

### වෘත්තිකයෙකුගේ කලත්‍රයන් (සැමියා/බිරිඳ) සහ සියළුම යැපෙන්නන්ට මෙරටට පැමිණීමට වීසා ලබාදීම්

ශ්‍රී ලංකාවට පැමිණෙන ඕනෑම වෘත්තිකයෙකුගේ කලත්‍රයන් (සැමියා/බිරිඳ) සහ සියළුම යැපෙන්නන්ට මෙරටට පැමිණීමට වීසා ලබාදීමටත් එම කලත්‍රයන් සහ යැපෙන්නන්ට වෘත්තිකයා විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරයක කළමණාකරුවෙකු, විධායකයෙකු ලෙස සේවය කිරීමටත් එසේ සේවය කිරීමේදී ඒ සඳහා අවශ්‍ය වලංගු සේවා වීසා ලබාදීමටත් එකඟ වී ඇත. ඉන් නොනවතින මෙම යෝජිත ගිවිසුම ස්වාධීන වෘත්තිකයාගේ යැපෙන්නන් විසින් ලබාගත් රැකියා වීසා බලපත්‍ර මත වෙනත් ආයතනයක කළමණාකරුවෙකු හෝ විධායක නිළධාරියෙකු වශයෙන් නොවන වෙනත් රැකියාවක් කිරීමට ද අවසර ලබා දී ඇත.

එමගින් ඔහු ස්වාධීන වෘත්තිකයෙකු බවට පත්වී ඔහුගේ/ඇයගේ සියළුම යැපෙන්නන්ද ගෙන්වා ගැනීමට හිමිකම ලබා ගෙන ඇත.

මෙම ක්‍රමය අනුව ඉන්දියානුවන්ගේ ආගමනය දාම ප්‍රතික්‍රියාවක් (Chain reaction) ලෙසට සීඝ්‍රයෙන් ව්‍යාප්ත වනු ඇත.